ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade 10 | විෂයය Subject බුද්ධ ධර්මය | පත්‍රය Paper I I | කාලය Time පැය 02 |

නම :- ......................................................................................... පංතිය :- ..........................

සැලකිය යුතුයි :-

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **02 වන ප්‍රශ්නයේ සිට 07 වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්නාවලියෙන් ඔබ කැමති ප්‍රශ්න 04 ක් ද තෝරාගෙන සම්පූර්ණ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

**II කොටස**

01. i. බෝසතාණන් වහන්සේ විසින් ජය ගන්නා ලද අභියෝග දෙකක් නම් කරන්න.

ii. පංචස්කන්ධය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

iii. සමථ භාවනාව වැඩීමෙන් මෙලොව දී ම පඤ්චාභිඥා උපදවා ගත හැක. ඉන් දෙකක් නම් කරන්න.

iv. යසෝදරා දේවිය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

v. "චිත්තං සමේතීති සමථෝ" යන්නෙහි අර්ථය ලියන්න.

vi. අෂ්ට සමාපත්ති ඉපද වූ බුද්ධකාලීන යෝගීන් (තවුසන්) දෙදෙනෙකු නම් කරන්න.

vii. වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

viii. "රහසත් පව් නොකොට - කෙලෙසරයනුත් දුරු කොට....." යන කවිය උපුටා ගත් ග්‍රන්ථය, රචිත යුගය හා එහි කතුවරයා නම් කරන්න.

ix. "පංච නීවරණ" එසේ හැඳින්වීමට හේතුව කුමක්ද?

x. ලෝකය හා ජීවිතය පිළිබඳ අපට ඇති කරගත හැකි සත්‍යාවබෝධය දෙයාකාර ය. නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. සිතේ සහනය මෙන් ම ප්‍රබෝධය ද ඇති කර ගැනීමට සිතත් ප්‍රඥාවත් දියුණු විය යුතු ය. එය කළ හැක්කේ භාවනාවෙනි.

i. "භාවනා" යන වචනය පැහැදිලි කර ඇති පාලි පාඨය හා සිංහල තේරුම ලියන්න. (ලකුණු 2)

ii. භාවනාවට පිවිසෙන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග තුන නම් කරන්න. (ලකුණු 3)

iii. බෞද්ධ භාවනාවේ ප්‍රධාන කොටස් දෙක නම් කර සමථ භාවනාව වැඩීමෙන්

ශිෂ්‍ය ජීවිතයට ලද හැකි ප්‍රයෝජන පිළිබඳ ව පැහැදිලි කරන්න. (ලකුණු 5)

03. බෝසත් සිරිත සැබෑ ලෙස ම අභියෝග රැසකින් පිරී පැවතුනකි. ඒ සියල්ල උන්වහන්සේ ජයගත්තේ ඉවසීම හා කැපවීම තුළිනි.

i. බෝසත් සිරිතේ අභියෝගාත්මක සිදුවීම් දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ඔබ ජීවිතයේ මුහුණ දී ඇති අභියෝග තුනක් ලියන්න. (ලකුණු 3)

iii. අභියෝවලට සාර්ථකව මහුණ දීම සඳහා ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග 05 නම් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

04. රාගාදී කෙලෙස් මුල් උදුරා දමන නුවණ ලබාගත යුතු ය. එය විපස්සනා ඤානය නම් වේ. ඒ සඳහා විපස්සනා භාවනාව වැඩිය යුතු ය.

i. විපස්සනා භාවනාව හඳුන්වන පාලි පාඨය ලියන්න. (ලකුණු 2)

ii. විපස්සනා භාවනාව ත්‍රිලක්ෂණ භාවනාව ලෙස හැඳින්වීමට හේතුව ලියන්න. (ලකුණු 3)

iii. පංචස්කන්ධය නම් කර ඒවායේ සරල අර්ථය ලියා, නාමරූප ලෙස බෙදා දක්වන්න. (ලකුණු 5)

05. සංසාරගත දුකින් මිදී නිවන් පසක් කරගනු පිණිස මිනිසාට මඟ පෙන්වනු ලබන්නේ මහා සංඝරත්නය විසිනි.

i. මහා සංඝරත්නය ලොව පහළ වූයේ කවර පොහෝ දිනක දී ද? (ලකුණු 2)

ii. බෞද්ධයෝ උපතේ සිට මරණය දක්වා සියලු සුවිශේෂී අස්ථාවල දී සංඝරත්නයේ ආශිර්වාදය ප්‍රාර්ථනා කරති. එවැනි අවස්ථා තුනක් නම් කරන්න. (ලකුණු 3)

iii. සංඝරත්නයෙන් සිදු වන ආගමික, අධ්‍යාපනික හා සමාජයීය සේවාවන් පිළිබඳ හැඳින්වීමක් කරන්න (ලකුණු 5)

06. දුටුගැමුණු රජතුමා විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට ජාතිය බේරා බුදු සසුන නොයෙක් අයුරින් නගාසිටවූ පාලකයෙකි.

i. දුටුගැමුණු රජතුමාගේ අභීත සටන් පාඨය නිවැරදිව ලියන්න. (ලකුණු 2)

ii. දුටුගැමුණු රජතුමා ඉදි කළ පූජනීය ස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 3)

iii. දුටුගැමුණු රජතුමාගේ චරිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5)

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

i. දුටුගැමුණු මහ රජතුමා

ii. වැලිවිට සරණංකර සංඝරාජ නාහිමි

iii. බෞද්ධ භාවනාව

iv. ධම්ම පදය

v. පටිච්ච සමුප්පාදය (ලකුණු 5 x 2 = 10)

-